# අභිලාෂය ප්‍රකාශ කිරීම

**ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ ජාතික ව්‍යාපෘතියේ උපදේශක තනතුරේ සේවාව ලබාගැනීම.**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ ජාතික ව්‍යාපෘතියේ උපදේශකයෙකු ලෙස සේවාව ලබා ගැනීම සඳහා ඇමුණුම් අංක 01 සඳහන් කාර්යයන් හා සේවාවන් සහ නියමයන් හා කොන්දේසිවලට අනුව අවුරුද්දක කාලයක් සඳහා අදාල සේවාව ලබා ගැනීමට කළමනාකාරීත්වය විසින් තීරණය කර ඇත.

ඒ අනුව පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද ලැබූ තැනැත්තන්ගෙන් යෝජනා කැඳවනු ලැබේ.

උක්ත තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද-

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබාදීම

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / රාජ්‍ය ආයතනයක කනිෂ්ඨ කළමණාකරන මට්ටමේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ (ඇමුණුම් අංක 01හි සඳහන්) අවම වශයෙන් වසර 02ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

උක්ත තනතුරට අදාල ඇමුණුම අංක 01හි සඳහන් කාර්යයන් හා සේවාවන් සහ සේවා නියමයන් හා කොන්දේසි සමඟ එකඟ වන්නේ නම් ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ ජාතික ව්‍යාපෘතියේ උපදේශක සේවාව අවුරුද්දක කාලයක් සඳහා ලබා ගැනීමට සලකා බැලීම සඳහා ඔබ විසින් සකස් කරන ලද ඔබගේ ජීවදත්ත තොරතුරු ඇතුලත්ව නිසි පරිදි පිලියෙල කරන ලද අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය පලපුරුද්ද පිලිබඳව සහතික කරන ලද සහතික පිටපත් සමඟ ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට 2020.12.30 දිනට පෙර එවීමට කටයුතු කරන්න. අයදුම්පත් එවීමේදී ලිපි කවරයේ වම්පය ඉහල කෙලවරේ තමා අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.


සභාපති

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

සව්සිරිපාය

අංක 123 විජේරාම මාවත

කොළඹ 07

විද්‍යුත් තැපෑල cidach@gov.lk

**<u>ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ ජාතික ව්‍යාපෘතියේ උපදේශක තනතුරේ කාර්යයන් හා සේවාවන්</u>**

01. අධිකාරියේ පහත සදහන් කාර්යයන් හා සේවාවන් උක්ත තනතුරට අයත්ය.

1. 1. නිපුණතා පාදක ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ ජාතික වැඩසටහන සදහා එහි නිර්ණායක යටතේ පුහුණුලාභීන් තෝරා ගැනිම.

1 2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NIATA) සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සමඟ එක්ව පුහුණුලාභීන් ලියාපදිංචි කිරිම.

1 3. ලියාපදිංචි කරන ලද පුහුණුලාභීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්විම.

1 4. පුහුණුලාභීන්ගේ මාසික දීමනා ලබා දිම සදහා අවශ්‍ය කටයුතු සිදු කිරිම.

1 5. ජාතික වෘත්තිය සුදුසුකම්(NVQ) සහතිකය ලබා දිම සඳහා ඇගයීම් වැඩසටහන් පැවැත්විම (පෙර හා අවසන් ඇගයීම් පරීක්ෂණ ලෙස)

1 6. පුහුණුලාභීන්ගේ පසු විපරම් වැඩසටහන.

1 2. **නිපුණතා පාදක ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ ජාතික වැඩසටහන සදහා එහි නිර්ණායක යටතේ පුහුණුලාභීන් තෝරා ගැනිම**

ඉදිකිරීම් ශිල්පී පුහුණුව යටතේ වන න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබා ගැනිමට කැමැත්තක් දක්වන දිස්ත්‍රික්කයේ අවුරුදු 18 - 45 අතර තරුණ තරුණියන් තෝරා ගැනිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිම

1 3. **ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NIATA) සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සමග එක්ව පුහුණුලාභීන් ලියාපදිංචි කිරිම.**

තෝරා ගන්නා ලද තරුණ තරුණියන් ඉදිකිරීම් සමාගම් වලට අනුයුක්ත කිරිම සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග සම්බන්ධිකරණය වෙමින් සුදුසු දිනයක් වෙන් කර පුහුණුලාභීන් ලියාපදිංචි කිරිම.

එදිනට ඔවුන්ගේ මාසික දීමනාව සදහා අවශ්‍ය කරන බැංකු ගිණුම් පිටපත් හා ජාතික හැදුනුම්පත් වල ඡායා පිටපත් ලබා ගැනිම සිදු කිරිම.

1 4. **ලියාපදිංචි කරන ලද පුහුණුලාභීන් සදහා පුහුණු වැඩසටහන් පැවැත්විම**

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NIATA) විසින් තෝරා ගත් පුහුණුලාභීන් ආධුනිකයන් ලෙස ලියාපදිංචි කිරීමෙන් පසුව සුදුසුකම් ලත් පුහුණුලාභීන් සඳහා මාස තුනක කාල සීමාවකට යටත්ව ඔවුන් සදහා න්‍යායාත්මක හා ප්‍රායෝගික වශයෙන් අදාල ක්ෂේත්‍ර ඔස්සේ නව තාක්ෂණික දැනුමක් ලබා දී නිපුණතාවයන් සහිත ශිල්පීන් ඉදිකිරීම් ක්ෂේත්‍රයට යොමු කිරිම.

මේ සදහා ක්ෂේත්‍රයේ දක්ෂ අත්දැකිම් හා පලපුරුද්දෙන් යුතු ඇගයීම් පරීක්ෂකවරු තෝරාගෙන අදාල පුහුණු පාඨමාලා පැවැත්විම සිදු කල යුතුය.

පුහුණුව ලබා දිමේ කාල සීමාව තුල පුහුණුලාභින්ගේ දැනුම සදහා අවශ්‍ය පොත් කට්ටල , නිල ඇදුම් හා වැඩසටහන පැවැත්වෙන දිනයට අදාල පැමිණිමේ ලේඛන ලබා ගැනිම.

15. **පුහුණුලාභින්ගේ මාසික දීමනා ලබා දිම සදහා අවශ්‍ය කටයුතු සිදු කිරිම**.

ඉදිකිරිම් සමාගම්හි වැඩ බිම් වල පුහුණුව ලබන ශිල්පින්ගේ ගෙවිම් සදහා අවශ්‍ය කරන මාස 3ට අයත් පැමිණිමේ ලේඛන අදාල නිලධාරින් සහතික කර එවිමෙන් පසු නිවැරදිදැයි පරික්ෂා කිරිම සහ ගෙවිම සදහා අනෙකුත් ලේඛන සකසා ගිණුම් අංශය වෙත ලබා දීම.

16. **ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) සහතිකය ලබා දිම සදහා ඇගයිම් වැඩසටහන් පැවැත්විම (පෙර හා අවසන් ඇගයිම් පරික්ෂණ ලෙස)**

මාස තුනක පුහුණු කාලය අවසන් විමෙන් පසු පෙර ඇගයිම් පරික්ෂණ හා අවසන් ඇගයිම් පරික්ෂණ ලෙස පරික්ෂණ දෙකක් සිදු කරනු ලබයි.

පෙර ඇගයිම් පරික්ෂණය වාචිකව සිදු කරනු ලබන අතර ඒ සදහා දින වෙන් කර ගැනිමේදි අදාල වැඩ බිමෙහි ප්‍රධානින් සමග හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරිමේ අධිකාරිය සමග  සම්බන්ධිකරණ කිරිම.

ඊට සහභාගි වන නිලධාරින්, ඇගයිම් පරික්ෂකවරුන් සහ පුහුණු ශිල්පින් දුරකථන හා ලිපි මගින් දැනුවත් කිරිම සහ අවශ්‍ය ලිපි ලේඛන සකස් කිරිම.

අවසන් ඇගයිම් පරික්ෂණය මගින් සිදු කරනු ලබන්නේ ශිල්පින්ගේ ප්‍රායෝගික හැකියාවන් හා දක්ෂතාවයන් වන බැවින් ඒ සදහා අවශ්‍ය අමු ද්‍රව්‍ය හා සුදුසු පරිසරය සකස් කර දිම . වැඩබිම් භාරව සිටින පරික්ෂක මහත්වරුන් සම්බන්ධ කරගෙන ශිල්පින්ගේ ප්‍රමාණයට අවශ්‍ය කරන ද්‍රව්‍යන් හා ස්ථාන ලබා ගැනිම සදහා කටයුතු කිරිම.

අවසන් ඇගයිම් පරික්ෂණය සදහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරිමේ අධිකාරිය(NIATA)  සමග සම්බන්ධිකරණ වෙමින් දිනය, වෙලාව, ඇගයිම් පරික්ෂකවරුන් ලබා ගැනිම .

පුහුණුලාභින් ඇතුළු සියලු දෙනා සදහා ලිපි ,ඊ මේල් සහ දුරකථන ඔස්සේ වැඩසටහන දැනුවත් කිරිම.

17. **පුහුණුලාභින්ගේ පසු විපරම් වැඩසටහන**

ඉදිකිරිම් වැඩ බිම් තුලදි පුහුණු කර ඉදිකිරිම් ක්ෂේත්‍රයට යොමු කරන ලද නිපුණතා සහිත ඉදිකිරිම් ශිල්පින් ක්ෂේත්‍රය තුල රැදි සිටිනවාද යන්න සොයා බැලිම සහ ඔවුන්ගේ සහතිකපත් නිසි වේලාවට ලබා දීමට කටයුතු කිරිම.

අදාල ක්ෂේත්‍රයන් තුල රදවා තබා ගැනිමට ඔවුන් ඉදිකිරිම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පනතට අනුව ලියාපදිංචි කිරිම, හැදුනුම්පත ලබා ගැනිමට අවශ්‍ය තොරතුරු ලබා දිම.

මෙම කාර්යයන් හැරුණු කොට ඉදිකිරිම් ශිල්පින් පුහුණු කිරිම ආරම්භ කල දින සිට අවසන් වන තෙක් ඒ සදහා අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන ලබා ගැනිම, ඒවා පියවිම, ඇගයිම් පරික්ෂක මහත්වරුන්ගේ දිමනා ගෙවිම් සකස් කිරිම මෙන්ම වැඩසටහනට අදාල තොරතුරු සාරාංශ ගත කිරිම ලිපි ගොනු පිළිවෙලට සැකසිම සිදු කල යුතුය.

## 2. සේවා නියමයන් හා කොන්දේසි

2.1. කාර්යයන් හා සේවාවන් කාල සීමාව 2020.10.15 දින සිට 2021.10.14 දින දක්වා වසරක කාලයකි.

2.2. සාමාන්‍ය කාර්යාල වේලාවන් පෙ.ව.08.30 සිට ප.ව.04.15 දක්වා වන අතර අත්‍යවශ්‍ය වේලාවන් හිදී මෙම කාල වේලාවන් පරිබාහිරව කටයුතු සිදු කළ යුතුය.

2.3. ආයතනය විසින් නියම කරනු ලබන පරිදි නීතිමය අවශ්‍යතා මත ඔබගේ වත්කම් හා බැරකම් ඔබ විසින් ප්‍රකාශ කල යුතුය.

2.4. ආයතනයේ සේවයේ දී සිටියදී ආයතනයේ ලිඛිත පූර්ණ අවසරයක් ඇතිව මිස ආයතනයේ ව්‍යාපාරික සහ / හෝ මෙහෙයුම් ක්‍රියාවලියට සම්බන්ධ කිසියම් රහස්‍ය සහ / හෝ තොරතුරු කිසිවක් ඔබට දැන ගැනීමට ලැබුන ද ඒවා එලිදරව් නොකිරීමට ද ඔබ බැඳී සිටියි.

2.5. සේවක අර්ථ සාදක අරමුදලේ සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ හිමිකම් නැත.

2.6. මෙම සම්පූර්ණ සේවාව ඉටු කිරීම සඳහා ඔබ ඉල්ලුම් කරනු ලබන ගාස්තුව කොපමණද යන්න ඔබගේ අයදුම්පතෙ ඔබ විසින් සඳහන් කල යුතුය.